# සූත්‍රාශ්‍රිත පාලි කාව්‍යවිචාර සිද්ධාන්ත: විමර්ශනාත්මක ප්‍රවේශයක්

- ඇහැලේපොල මහින්ද හිමි

## ප්‍රවේශය

දර්ශනය සහ කලාව මානව චින්තනයෙහි ප්‍රගමනය උදෙසා මානවයා විසින් ම නිර්මාණය කරන ගත් උත්කෘෂ්ඨ අංග දෙකකි. යථාර්ථවාදය හෙවත් සත්‍යය ගවේෂණය කිරීම දර්ශනයෙහි අභිමතාර්ථය[1] වන අතර සත්‍යය අවබෝධ කර ගැනීම වෙනුවට එය සෞන්දර්යාත්මකව ආස්වාදය කිරීම කලාවේ අභිමතාර්ථය යි. කලාව වින්දනීය සංකල්පයක් වන අතර සාහිත්‍යය එහි විශාල සීමාවක් නියෝජනය කරයි. සාහිත්‍යය යන වචනයට ඒකමතික නිර්වචනයක් නිර්මාණය වී නොමැත. එහි අර්ථමය සිමාවක් නොපෙනීම ඊට හේතු වන්නට ඇත. සාහිත්‍යය යන පදයෙන් ඒකීයභාවය, සංගතභාවය, සමවායීභාවය යන අර්ථ හැඟවේ.[2] පාලි පිටක සාහිත්‍යයෙහි එන "සහිත" යන්න ඊට පර්යායව යෙදේ.[3] ලිඛිත වාචික හෘද්ගත මනෝභවයන් උද්දීපනය කරන රමණීය අද්දැකීම සාහිත්‍යය නම් වේ. සාහිත්‍යය ජීවිතයේ පරිපූර්ණ අංගයක් සේ සංස්කෘත සුධීහු පිළිගත්හ. සාහිත්‍යය, සංගීතය ආදි නිර්මාණ පරිශීලනය නොකරන්නා අං සහ වලිගය නැති තිරිසනෙක් බඳු යැයි භර්තෘහරි ප්‍රකාශ කර ඇත්තේ එහෙයිනි.[4]

කාව්‍යය සංගීතය ආදී ප්‍රස්තුත කලාව නම් සුවිශාල කුලකයේ උපකුලක වශයෙන් පිළිගැනේ. කිසියම් ආශ්වාදනීය කම්පනයක් ඇති කරන නිර්මාණ නවකතා, කෙටිකතා, කාව්‍ය, නාට්‍ය, චිත්‍රපට, මූර්ති ආදි දෑ කලා කෘති[5] වශයෙන් හැඳින්වේ. මිනිසාට අවැසි සුචරිතාත්මක දැනවීම, සුන්දරත්වය පිළිබිඹු කිරීම, ජීවිතය ඇති සැටියෙන් හෙළි කිරීම[6] ආදිය කලාවේ පරමාර්ථ අතර ප්‍රධාන වේ. කලාව ජීවනය සඳහා ය, කලාව

අත්තානුභූතිය සඳහා ය සහ කලාව ජීවනයේ කම්කටොලු අමතක කොට එයින් ජීවන විනෝදය ලබා ගැනීම සඳහා ය[7] යනු කලාව පිළිබඳ ව සුභාවිත නිර්වචනයන් ය. කලාවට අදාළ වැදගත් මෙන්ම ප්‍රචලිත විෂය පථයක් වන්නේ කාව්‍යයයි.

## කාව්‍යය

ජීවන විනෝදය සහ ජීවන අවබෝධය ලබා දෙන කලාවේ උත්කෘෂ්ඨ ම අංගය වශයෙන් "කාව්‍යය " හැඳින්වීම යෝග්‍ය ය. කාව්‍ය යන්නට නිශ්චිත අර්ථ විග්‍රහ ඉදිරිපත් කිරීම අසීරු කටයුත්තකි. කාව්‍ය යන්නට කිසිවෙකුට නිශ්චිත ආකෘතිකමය හැඩතලයක් ලබාදීමට නොහැකිවීම ද ඊට හේතුව යි. කිසියම් කෙනෙක්, දෙයක්, සිද්ධියක් වර්ණනා කිරීම යන අර්ථයෙන් කාව්‍ය යන වචනය සැකසී ඇත.[8] සිතුරා, කවිකෘත, රසයෙන් යුක්ත පද්‍ය විද්‍යාත්මක වාක්‍ය සමුදාය, වර්ණනා කටයුතු කවීහු [9] යන අර්ථ ද එහි වාච්‍යාර්ථය නිරූපණය කරයි. මිනිස් සිතෙහි අභ්‍යන්තරය ස්පර්ශ කරවන හෘදයේ සිදුරු අතරින් ගලායන ප්‍රීතියේ අවසාන අවස්ථාව කරා ගමන් කරවන යමක් වේ නම් එය කාව්‍යය යි.[10] බටහිර සාහිත්‍යවේදීන් ද හෘද්ගතභාවයන් විදහා පෑමේ භාෂාව වශයෙන් කාව්‍ය හඳුන්වා ඇත.[11] රසය කෙනෙකුගෙන් කෙනෙකුට වෙනස්ව ජනිත වන දෙයකි. වර්ණය, සංගීතය සහ නර්තනය ද එලෙස ය. එබැවින් කාව්‍ය යන්න ද කෙනෙකුගෙන් කෙනෙකුට ගෝචර වන සහ තත් අන්තර්ගත රසය ජනිත වන ආකාරය අනුව කාව්‍ය පිළිබඳ ව පෙර-අපර දෙදිග බොහෝ මතවාද නිර්මාණය වී ඇත. ''රසය ආත්මය කොට ගත් වැකිය කාව්‍ය වේ'',[12] ''එක්තැන් වූ අර්ථයත් ශබ්දයත් කාව්‍යය වේ''[13] වැනි නිර්වචන මඟින් කලින්කලට බිහි වූ පෙරදිග කාව්‍යවිචාරවාදයන්හි කාව්‍යය යන්නෙහි අර්ථය, සංකල්පමය වශයෙන් නිර්වචනය වී ඇත. මේ අනුව රමණීය අර්ථ සහ ශබ්ද ආදියෙන් මනසෙහි රසය ජනිත කරවන නිර්මාණාත්මක ලියැවීම හෝ කියැවීම කාව්‍යය සේ අර්ථකථනය කළ හැකිය.



සංස්කෘත විචාරකයෝ කාව්‍ය යන්නෙන් ගද්‍ය පද්‍ය චම්පු යන කාව්‍ය ප්‍රභේද තුනත් [14] හා දෘශ්‍ය කාව්‍යත් ගණනය කළහ. කාව්‍යය, පද්‍යය සහ කවිය යන යෙදුම් අතර සියුම් වෙනස්කමක් දැකිය හැක. පද්‍ය යනු මෙයට ඉඳුරා ම වෙනස් වූවකි. භාරතීය සාහිත්‍යවේදීන් ''ඡන්දසින් බඳනා ලද්ද පද්‍යය'' වශයෙන් පද්‍යය විවරණය කර ඇත. මේ අනුව පද්‍ය සඳහා ඡන්දස අත්‍යවශ්‍ය සාධකයෙකි. එමෙන්ම ඡන්දස අභ්‍යන්තරයෙහි සිටිමින් ඡන්දසත් පද්‍යයත් සම්බන්ධීකරණය කරන වෘත්ත ද පද්‍යයක වැදගත් පාර්ශ්වයකි. විරිත (වෘත්ත) වූ කලී පද්‍යයක අවශ්‍ය අංගයකි.[15] මේ අනුව රමණීය ශබ්දාර්ථයන්ගෙන් සමුපේත ඡන්දස් හා වෘත්තයන්ගෙන් ශෝභිත කාව්‍යය විශේෂය, පද්‍යය (Poetry) වශයෙන් සැලකිය හැකිය. කාව්‍ය යන සංස්කෘත වදන සිංහලයට කවිය ලෙස ව්‍යවහාරයට පැමිණ ඇත. එයින් සඳැස්, නිසඳැස් හෝ සිව්පද ආකෘතියට අයත් සාහිත්‍ය නිර්මාණ වාච්‍ය වේ.

කාව්‍ය යන්නෙන් නාට්‍ය හෝ පද්‍ය ආදිය පමණක් නොව පොදුවේ සියලු සාහිත්‍යාංගයන් ම අදහස් කෙරෙන බව ඒ. වී. සුරවීරගේ අදහස යි.[16]

පෙරදිග කාව්‍ය මාර්ගයෙහි ආදි කර්තෘත්වය රාමායණ කර්තෘවර වාල්මීකිට හිමි වේ.[17] රාමායණය සංස්කෘත කාව්‍යයෙහි (පෙරදිග කාව්‍ය සම්ප්‍රදායෙහි) ආරම්භක ලක්‍ෂණ නිරූපණය කරන (රාමායණං ආදි කාව්‍යම්) වීරකාව්‍යය වශයෙන් ද පිළිගැනේ.[18] වාල්මීකි මුනිවරයා ජලස්නානය සඳහා තමසා නදී තීරයට සවස් කාලයේ ගමන් කරනවිට වැද්දෙක් අත්තක පෙම්සුව විඳින කොස්වාලිහිණි යුවළක ලිහිණියාට හීයකින් විද බිම දමා මරා දැමුවේය. මුනිවරයාගේ සිතේ හදිසියේ හටගත් වේදනාව පදනම් කරගෙන මුනිවරයාගේ මුවින් නිරායාසයෙන් පහත පද්‍යය පිට විය.

"මා නිශාද ප්‍රතිෂ්ඨාං ත්වං - අගමඃ ශාශ්වතී සමඃ
යත් ක්‍රෞඤ්චමිථුනාදේකං - අවධීඃ කාමමෝහිතම්"[19]

එහි අර්ථය ''නිශාදය, කාමයෙන් මෝහනය වී සිටියා වූ කොස්වා ලිහිණියන් දෙදෙනාගෙන් එකෙකු ඔබ විසින් මරනු ලැබුවේ ද එහෙයින් ඔබට කිසි කලෙකත් සැනසීමක් නොලැබේවා'' යනුයි. මෙයින් පැහැදිලි වන්නේ කාව්‍යයක් නිර්මාණය වීමට කවියාගේ සිත තුළ යම් සංසිද්ධියක් මත ගොඩනැගුණු සිතුවිලි ධාරාවන් අවශ්‍ය බව යි. කාව්‍ය සිතුවිලි කවියාගේ හදවතෙහි රෝපණය වීමට අවශ්‍ය මානසික තත්ව කාව්‍ය සම්පත්තිය වශයෙන් දැක්විය හැකිය. එම කාව්‍ය සම්පත්තිය පිළිබඳ විග්‍රහය පෙරදිග කාව්‍යවිචාරවල දී සංවර්ධනයට පත්ව ඇත්තකි. උසස් කාව්‍යයක් බිහිවීමට අවශ්‍ය මූඛ්‍ය සාධකය ප්‍රතිභාව බව කාව්‍යවිචාරකයෝ පිළිගත්හ. කවිත්වයට කාරණය කවියා සතු ප්‍රතිභාව යැයි ජගන්නාථ පිළිගනී. අපූර්ව දේ නිපදවීයෙහි දක්ෂ බුද්ධිය ප්‍රතිභාව බව ඔහු තවදුරටත් පැහැදිලි කර ඇත. දණ්ඩීන් කාව්‍යාදර්ශයෙහි කී පරිදි නිසර්ගයෙන් ලත් ශක්තිය, බහුශ්‍රැතත්වය හා සතතාභ්‍යාසය කාව්‍ය සම්පත්තියට හේතු වේ. පූර්ව ජන්මයන්හි පුරුදු කළ බැවින් එකණෙහි උපන් ප්‍රඥාව ප්‍රතිභාව නම් වේ.[20] අපූර්ව වස්තු නිර්මාණයෙහි ශූර ප්‍රඥාව[21] ප්‍රතිභාව වේ. මෙය කාව්‍යයෙහි බීජය ලෙස ද හැඳින්වේ.[22] "කාව්‍ය ශක්තිය" වශයෙන් ද කාව්‍යකරණයෙහි අතිශය දුර්ලභ අවස්ථාවක් වශයෙන් ද ප්‍රතිභාව අග්නිපුරාණයෙහි විස්තර වී ඇත්තේ පහත පරිදිය.

"නරත්වං දුර්ලභං ලොකෙ - විද්‍යා තත්‍ර සුදුර්ලභා
කවිත්වං දුර්ලභං ලොකෙ - ශක්තිස්තත්‍ර සුදුර්ලභා"[23]

ශක්තිය, ලෝකය, ශාස්ත්‍ර හා කාව්‍ය ආදිය විමසීම නිසා ඇතිවන නිපුණත්වය හා කාව්‍ය දන්නවුන් වෙතින් ඉගෙනීමෙන් කරන අභ්‍යාස කාව්‍ය සම්පත්තියට හේතු සේ මම්මට දක්වා තිබේ. මේ අනුව ප්‍රතිභාව හැරුණුවිට කාව්‍ය සම්පත්තියට තවත් කරුණු අවශ්‍ය බව පැහැදිලි වේ.

සූත්‍රාශ්‍රිත පාලි ගාථාවන් බෞද්ධ කාව්‍යය සංකල්පයට ප්‍රවේශයකි. බෞද්ධ කාව්‍යය සංකල්පයෙහි පදනම ගොඩ නැගී ඇත්තේ සූත්‍රාශ්‍රිත පාලි ගාථාවලිනි. අංගුත්තර නිකායේ කවි



සූත්‍රය බෞද්ධ කාව්‍යය සංකල්පයෙහිලා ප්‍රමුඛ මූලාශ්‍රය කර ගත හැකිය. එහිදී කවියන් හතර දෙනෙක් ගැන සඳහන් වේ[24]. ඉන් පටිභාන කවියා ඒ අතර උසස් බවත් එය ප්‍රතිභාව නැමැති කාව්‍ය සම්පත්තියට සමාන වේ. (වංගීස තෙරණුවන් පටිභාන කවියන් අතර ප්‍රමුඛ වේ.) කාව්‍යය රසවිඳීම නිර්වාණාවබෝධය ලබා ගැනීමට පමා කිරීමක් (පමත්ත) වශයෙන් ද එමනිසා කාව්‍යය ලෞකිකත්වය තුළ සත්ත්වයා මත් වීමක් (මත්ත) සිදු කරන බැවින් බුදු සමය ලෝකෝත්තර පදනම මත කාව්‍ය සංකල්පය විවරණය කිරීමේ දී කවිය ගීතය නාට්‍යය ආදිය හැඬීමක්, උමතුවක් වශයෙන් හඳුන්වයි.[25] තවද භික්ෂූන් වහන්සේලා ධර්මය ගීත ස්වරයෙන් ගායනා කිරීම දුකුලා ඇවැතකි.[26] බෞද්ධ කාව්‍යය සංකල්පය පිළිබඳ ව නිශ්චිත අර්ථකථනයක් සංයුත්ත නිකායෙහි දේවතා සංයුක්තයෙහි දැක් වේ.

''ඡන්දෝ නිදානං ගාථානං - අක්ඛරා තාසං ව්‍යඤ්ජනා
නාම සන්නිස්සිතා ගාථා - කවි ගාථානමාසයො''[27]

ගාථාවන්ගේ නිදානය ඡන්දස වේ. ගාථාවන් උපදින්නේ අක්ෂරයන්ගෙනි. නාම ඇසුරු කොට ගෙන ගාථාවන් පවතී. ගාථාවන්ගේ ප්‍රභවය, වාසස්ථානය නම් කවියාය. මේ අනුව ගාථාවන් හෙවත් කාව්‍යය පිහිටා තිබෙන ආධාරය වන්නේ කවියාය.

## කාව්‍යවිචාරය

අගනා කාව්‍යයක් හඳුනාගන්නේ කෙසේද කාව්‍යමය ආශ්වාදයේ ස්වභාවය කෙබඳුද යන ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට දරන ලද ප්‍රයත්නයක ප්‍රතිඵල වශයෙන් ශතවර්ෂ ගණනාවක කාලය තුළ විවිධ අදහස් උදහස් පළ වී ඇත. ඒවා කාව්‍යවිචාර සේ හඳුන්වනු ලැබේ. පෙරදිග සේම අපරදිග ද බිහි වූ පෘථුල කාව්‍යවිචාරවාද රැසකි. පෙරදිග සාහිත්‍ය විචාර කලාවේ අග්‍රස්ථානය සංස්කෘත සාහිත්‍යයට හිමි වේ. භරතමුනි, භාමහ, වාමන, උද්භට, රුද්‍රට, ආනන්දවර්ධන, විශ්වනාථ, දණ්ඩීන්,

මිම්මට ඒ අතරින් ප්‍රමුඛ වේ. මොවුහු කාව්‍ය සම්බන්ධ යම් යම් ප්‍රමුඛ ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ගවේෂණය කළහ.

1. කාව්‍ය යනු කුමක් ද?
2. කාව්‍යයේ ශරීරය වනුයේ කුමක් ද?
3. කාව්‍ය ආත්මය වනුයේ කුමක් ද?
4. කාව්‍ය පිළිබඳ සාරගර්භ නිර්වචන කුමක් ද?
5. කාව්‍යයේ ප්‍රයෝජනය කුමක් ද?
6. පාඨකයා කාව්‍යයෙන් ලබන ආශ්වාදයේ ස්වභාවය කෙබඳු ද?
7. කාව්‍යෝක්තියත් ශාස්ත්‍රෝක්තියත් අතර පවතින වෙනස කෙබඳු ද?
8. ඇත්ත ඇති සැටියෙන් පවසන වාර්තා කථනයත් සාමාන්‍ය බසත් ඉක්මවා කාව්‍යයේ පවතින විශේෂ ගුණය කෙබඳු ද?
9. කවියෙකු සතු අවශ්‍යයෙන් පැවතිය යුතු සුදුසුකම්, කාව්‍ය හේතු මොනවා ද?

උක්ත ප්‍රශ්නවලට කාලාන්තරයක් තිස්සේ විවිධ විචාරකයින් විසින් සැපයූ පිළිතුරු සමුදය කාව්‍ය විචාරය වශයෙන් සැලකේ.[28] කාව්‍යය සතු කාව්‍ය ශරීරය හා කාව්‍ය ආත්මය අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාවය විවේචනය කිරීම ප්‍රමුඛ බව උක්ත ප්‍රශ්න විග්‍රහ කිරීමෙන් අවබෝධ කරගත හැකිය. කාව්‍ය ශරීරය කාව්‍යයේ බාහිර ආකෘතිය වේ. එය ඡන්දසින් යුක්ත, වෘත්තිකින් යුක්ත ගද්‍යයක් හෝ පද්‍යයක් විය හැකිය. කාව්‍ය ශරීරයට වඩා කාව්‍යවිචාරකයන් නැඹුරු වී ඇත්තේ කාව්‍ය ආත්මය පිළිබඳ ව විමසීමට යි. කාව්‍ය ආත්මය යනු කාව්‍යක අභ්‍යන්තර අංගය යි. කාව්‍යයෙහි ආත්මය විසින් හෙළිකරන ධර්මතාවට පෙරදිග විචාරකයින් විවිධ හැඩතල සැපයීමට උත්සාහ ගෙන ඇත. ඒවා පහත පරිදි වෙන් කර දැක්විය හැකිය.

1. රසවාදය - භරතමුනි (ක්‍රි. ව. 1-2 සියවස)
2. අලංකාරවාදය - භාමහ (ක්‍රි. ව. 5 වන සියවස අග)



3. ගුණ රීතිවාදය - දණ්ඩින් (ක්‍රි. ව. 8 සියවස)
4. රීතිවාදය - වාමන (ක්‍රි. ව. 8 වන සියවස අග)
5. ධ්වනිවාදය - ආනන්දවර්ධන (ක්‍රි. ව. 9 වන සියවස)
6. වක්‍රෝක්තිවාදය - රාජකුන්තක (අවිනිශ්චිතයි)
7. ඖචිත්‍යවාදය - ක්ෂේමේන්ද්‍ර (අවිනිශ්චිතයි)[29]

ඒ ඒ කාලවකදී විසූ ලේඛකයෝ මෙම වාද හතෙන් එකක් විශේෂ කොට එය කාව්‍යයේ ආත්මය බව තහවුරු කරන්නට පෙළඹුණහ.

## පාලි කාව්‍යවිචාරය

සංස්කෘත කාව්‍යවිචාරය හා ගැළපී යා හැකි කාව්‍යවිචාර ක්‍රමයක් පාලියෙහි බිහි වී නැත. දැනට විද්‍යාමාන එකම පාලි කාව්‍යවිචාරවාද ග්‍රන්ථය ක්‍රි. ව. 12 සියවසේ දී සංඝරක්ෂිත හිමියන් විසින් රචිත සුබෝධාලංකාරය යි. බොහෝසෙයින් සංස්කෘත කාව්‍යවිචාරවලට අනුගත වුවද සුබෝධාලංකාරය අනන්‍ය වූ ලක්ෂණ ඇති කෘතියක් බව අමතක නොකළ යුතු වේ.

සංඝරක්ෂිත හිමිගේ පිළිගැනීම අනුව දෝෂවලින් තොර එකට බැඳුණු ශබ්දාර්ථ යෝගය කාව්‍යය නම් වේ. (බන්ධො ච නාම සද්දත්ථා සහිතා දොසවජ්ජිතා) සංස්කෘත කාව්‍යවිචාරකයන් නොදුටු දෝෂ හීනත්වය කාව්‍යයේ ආත්මය සේ සැලකීමට පාලි කාව්‍ය විචාරය යොමු යොමු වූ ආකාරය ම එහි නව්‍යතාවය තහවුරු කරයි. අනෙක් අතට දෝෂ හීනත්වය යනු ගුණ සහිතත්වය හෙයින් ගුණ සහිත ශබ්ද අර්ථ දෙක කාව්‍යය සේ ගිනිය යුතුය. එම පදනම නිසා සුබෝධාලංකාරයේ පළමු පරිච්ඡේද දෙක ම වැය වී ඇත්තේ දෝෂ දැනීමට හා ඉවත් කිරීමටය. තෙවැන්න වෙන් වී ඇත්තේ ගුණ දැනගැනීම කෙරෙහි ය. ඒ අනුව කෘතියේ අඩකටත් වැඩිප්‍රමාණයක් කාව්‍යය පිළිබඳ හැඳින්වීමේ ලක්ෂණ කෙරෙහි යොමු කරලීමට සංඝරක්ෂිත හිමි උත්සාහ දරා ඇති බව කිව යුතුය. එහෙයින් ගුණ දෝෂ විචාරය පාලි කාව්‍යවිචාරයේ මුඛ්‍ය ලක්ෂණයක් සේ හඳුනාගතයුතු වෙයි.

සුබෝධාලංකාරයේ සිව්වැනි හා පස්වැනි පරිච්ඡේදවලින් ඉදිරිපත් වන අලංකාර හා රසභාව සංකල්ප එහි අනෙක් ලක්ෂණ සේ ගත යුතු වෙයි. මේ අනුව ගුණ - දෝෂ, අලංකාර හා රසභාව යන කරුණු තුන උසස් කාව්‍යයක් සඳහා අවශ්‍ය මූලික සාධක බව පාලි කාව්‍යවිචාරවාදයේ පිළිගැනීම බව පැහැදිලි ය. එහෙත් මෙහි ලා මතු වන ප්‍රධාන ගැටලුව වන්නේ එයට අදාළ විවිරණ බොහෝවිට සංස්කෘතයෙන් ණයට ගැනීමට සංඝරක්ෂිත හිමියන් යොමු වීම යි. එය පාලි සම්ප්‍රදායට ආවේණික කාව්‍යවිචාර ක්‍රමයක් සොයා යෑමට අප පොළඹවාලයි. ඒ සඳහා ඇති එක ම යොමුව පාලි සූත්‍ර මිස අනෙකක් නොවන බව අවිවාදිත ය.

## සූත්‍රාශ්‍රිත පාලි කාව්‍යවිචාරය

පාලි සූත්‍ර ආශ්‍රයෙන් අන්වේෂණය කළ හැකි කාව්‍යවිචාර ක්‍රමයක් මෙතෙක් පර්යේෂණාත්මකව ඉදිරිපත්ව නැත. කාව්‍ය සම්බන්ධයෙන් විවිධ ලේඛනයන් කලින්කල පිළිතුරු සෙවූ ප්‍රශ්නවලට සූත්‍ර ආශ්‍රයෙන් පිළිතුරු සෙවීමට උත්සාහ කළහොත් සූත්‍රාශ්‍රිත පාලි කාව්‍යවිචාරයේ මූලික මාවත විවර කර ගත හැකි වෙයි. අංගුත්තර නිකායේ කවි සූත්‍රය එහි ලා ප්‍රමුඛ මූලාශ්‍රය කර ගත හැකිය. එහිදී කවියන් හතර දෙනෙක් [30] ගැන දන්වන අතර පටිභාන කවියා ඒ අතර උසස් බවත් එය ප්‍රතිභාව නැමැති කාව්‍ය සම්පත්තියට සමාන බවත් වංගීස තෙරණුවන් පටිභාන කවියන් අතර ප්‍රමුඛ බවත් ඔලිවර් අබේනායක දක්වයි.[31] මෙහිලා ඊළඟ අවධානය යොමුවිය යුතු වන්නේ කාව්‍යකරණයේ දාර්ශනික පදනම වෙත ය. ඊට පිළිතුරු සෙවීමට චතුර්විධ කවියන් පිළිබඳ විවරණය සුතමය චින්තාමය හා භාවනාමය ප්‍රඥා සමඟ ගළපාගත යුතු වෙයි. එවාට පාලි කාව්‍යවිචාරය ප්‍රඥාව හා සම්බන්ධ වන ආකාරය මතු කර ගත හැකිවෙයි. එමෙන්ම අලංකාර හා රසභාව පිළිබඳ විග්‍රහයක් ද සූත්‍රවල එයි. දැනට ප්‍රචලිත අලංකාරවලට වඩා වෙනස් වූ අලංකාර පාලි පද්‍යයන්හි දක්නට ඇත. ඒ අනුව හැඟී යන්නේ සූත්‍රාශ්‍රිත පාලි කාව්‍යවිචාර සිද්ධාන්ත පද්ධතියක් ඇති බවයි.



## සමාලෝචනය

පාලි පිටක සාහිත්‍යාගත සූත්‍ර දේශනා ආශ්‍රයෙන් සංස්කෘත කාව්‍ය විචාර සිද්ධාන්තයන්ට අන්තර්ගත නොවන පාලියට ම ස්වාධීන කාව්‍ය විචාර සිද්ධාන්ත සකසා ගැනීම කාව්‍යය, කවියා, කාව්‍යාංග ආදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිදු කළ යුත්තකි. ඒ සඳහා සංස්කෘත කාව්‍ය සාහිත්‍යය සහ සංස්කෘත කාව්‍ය විචාර සාහිත්‍යය සම්ප්‍රදාය සපුරා ප්‍රතික්ෂේප කිරීම යුක්තිසහගත මෙන්ම ශාස්ත්‍රීය ප්‍රවේශයක් ද නොවන්නකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


1. කාව්‍යාලංකාර සූත්‍ර වෘත්ති, 1966, සංස්- ආනන්ද කුලසූරිය,ගුණසේන ප්‍රකාශන, කොළඹ.
2. කාව්‍යාදර්ශය, 2001, සංස්. වැලිවිටියේ ප්‍රේමරතන හිමි, සමයවර්ධන ප්‍රකාශන, කොළඹ.
3. චුල්ලවග්ගපාළි, 2005, ඛුද්දක වත්ථුක්ඛන්ධකය, බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.
4. දීඝ නිකාය, සම්පසාදනීය සූත්‍රය; 1999, බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.
5. ථෙරගාථා, 2005 , බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.
6. බාලාවතාරය, 1998" සංස්, වෑගම පියරතන හිමි, ගොඩගේ ප්‍රකාශන, කොළඹ
7. මජ්ඣිම නිකායට්ඨකථා, 2005, ඔපම්ම වග්ග, බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.
8. සුත්ත නිපාත, 2005, මුනි සූත්‍රය, බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.
9. වුත්තෝදය, 2000, සංස්කරණය - ලබුගම ලංකානන්ද හිමි, ගොඩගේ ප්‍රකාශන , කොළඹ
10. වෘත්තරත්නාකරය,2001, _සංස්කරණය - වැලිවිටියේ සෝරත හිමි, සමයවර්ධන ගොඩගේ ප්‍රකාශන , කොළඹ.
11. සංයුත්ත නිකාය, දේවතා සංයුත්තය,2005, බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.

12. අංගුත්තර නිකාය, කවි සුත්ත, 2005, බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණය, නැදිමාල, දෙහිවල.
13. සුබෝධාලංකාරය, 2008, ද්විතීය සංස්කරණය - ලබුගම ලංකානන්ද හිමි, ගොඩගේ ප්‍රකාශන, කොළඹ

## ද්විතීයික මූලාශ්‍රය

1. අබේසිරිවර්ධන, 2013, ආනන්ද, රසාස්වාදය හා චමත්කාරය, සමීර ප්‍රකාශන, බත්තරමුල්ල.
2. අමරසේකර, ගුණදාස, 2010, විනෝදය හා විචාරය, විසිදුණු ප්‍රකාශන.
3. කාව්‍යාලංකාර සූත්‍ර වෘත්තිය, 1966, සංස් - ආනන්ද කුලසූරිය, ගුණසේන සමාගම, කොළඹ.
4. කාරියවසම්, තිස්ස, 2009, බටහිර සාහිත්‍ය විචාර ප්‍රවේශය, ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
5. ගුණසිංහ, සිරි, විචාරකයා හා විචාරය, 1963, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.
6. ගුණසේකර, බන්දුසේන, 2012, සාහිත්‍ය - ජනශ්‍රුතිය හා සංස්කෘතිය, ආරිය ප්‍රකාශකයෝ, වාරියපොල.
7. ජයතිලක, කේ, 1995, සාහිත්‍ය නිර්මාණයේ මුල් පොත, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.
8. ඥානසීහ හිමි, හේන්පිටගෙදර, 2013, සාහිත්‍යය, සමයවර්ධන, කොළඹ.
9. තිලකසිරි, ජයදේව, 2007, සංස්කෘත කාව්‍ය සාහිත්‍ය, ගොඩගේ සහොදරයෝ, කොළඹ.
10. නාරම්පනාව, කීර්ති, 2003, භාරතීය කාව්‍ය විචාර, සමීර ප්‍රකාශන, බත්තරමුල්ල.
11. ප්‍රඥාකීර්ති හිමි, කොටහේන, 1946, සාහිත්‍ය හා සමාජය, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැළණිය.
12. පියරතන, වෑගම, 2006, සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය.
13. මහානාම හිමි, බඹරන්දේ, 1981, කාව්‍ය විචාර දර්ශන, ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
14. මුනිදස, කුමාරතුංග, 2014, ප්‍රබන්ධෝපදේශය, විසුරුණු ප්‍රකාශන.
15. රත්නායක එම්. පී. 2012, සංස්කෘත කාව්‍ය විචාරය, සරසවි ප්‍රකාශන, නුගේගොඩ.
16. සරච්චන්ද්‍ර, එදිරිවීර, 2015, කල්පනා ලෝකය, ගොඩගේ ප්‍රකාශන, කොළඹ.



17. සරත්චන්ද්‍ර, එදිරිවීර, 1998, සාහිත්‍ය විද්‍යාව, ගොඩගේ ප්‍රකාශන, කොළඹ.
18. සුරවීර, එ. වී. 2009, සාහිත්‍ය විචාර රචනා, විසිදුණු ප්‍රකාශන.
19. සුරවීර, ඒ. වී, 2013, ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය, සරසවි ප්‍රකාශන, නුගේගොඩ.

## ශාස්ත්‍රීය සඟරා

1. අබේසිරිවර්ධන, ආනන්ද, "අලංකාරවාදය සහ එකී සංකල්පය පැරණි සිංහල කාව්‍ය කෙරෙහි දක්වා ඇති ආකල්පය", ශ්‍රී සුමනසාර සම්භාවනා, 2006, සංස් - මාදුරුඔයේ ධම්මිස්සර හිමි ප්‍රමුඛ පිරිස, උදය ග්‍රැෆික්, බොරලැස්ගමුව.
2. ගුණසේන, දේශප්‍රිය, "පාලි කාව්‍ය විචාර මූලධර්ම කෙරෙහි සංස්කෘතයේ ආභාසය", අනුදීපනා, 2011, සංස්:- වැලිවිට සෝරත හිමි මාගධී ප්‍රකාශන, පුවක්පිටිය.
3. විජේරත්න, විමල්, "නිර්මාතෘ, නිර්මිත හා ප්‍රමාතෘ", සම්මානි, 2005, සංස් - ඔක්කම්පිටියේ ප්‍රඥාසර හිමි, ලස්සන ප්‍රෙස්, වැල්ලම්පිටිය.
4. මහින්ද හිමි, ඇහැලේපොල, "කාව්‍යයේ ස්වභාවය පිළිබඳ පාලි විචාරණය", මාගධී, 2016, සංස් :- කේ. ඒ. වීරසේන ප්‍රමුඛ පිරිස, ගොඩගේ සමාගම, කොළඹ.
5. පියරතන හිමි, වෑගම, "ගාථා භාවිතය පිළිබඳ බෞද්ධ ආකල්පය", ශාස්ත්‍රීය ලිපි සරණිය I, 2014, සංස් :- පියරතන හිමි, ගොඩගේ ප්‍රකාශන.
6. පඤ්ඤාරතන හිමි, ගෝනදෙණියේ, "කාව්‍ය ගුණ, දෝෂ හා රීති", ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය, 2009-2010., සංස් :- අභයතිස්ස හිමි, ප්‍රාචීන භාෂෝපකාර සමාගම, කොළඹ.
7. ධම්මානන්ද හිමි, මකුරුප්පේ, "කාව්‍ය විචාරය හා රසාස්වාදය පිළිබඳ බෞද්ධ මතය", නිවන් මග, 2001, සංස් :- චන්ද්‍රතිලක බුලත්සිංහ, රජයේ මුද්‍රණාලයේ බෞද්ධ සංගමය.
8. "සුබෝධාලංකාරය - කාව්‍යාලංකාර පිළිබඳ සංඝරක්ඛිත හිමියන්ගේ විග්‍රහය", ධර්මරාජ, 2007, සංස් :- මහමිතව පඤ්ඤාරතන හිමි, කනදුල්ල පිරිවෙණ, කුලියාපිටිය.
9. "පාලියේ අලංකාර භාවිතය", පියදාස රණසිංහ ශාස්ත්‍රීය සංග්‍රහය, 2014, සංස් :-එල්. පියරතන හිමි ප්‍රමුඛ පිරිස, , පියදාස රණසිංහ පදනම, රාගම.
10. ගල්මන්ගොඩ, සුමනපාල, "භාෂාව, සත්‍යය හා යථාර්ථය- ථෙරවාද මතය" අත්තුඩාවේ ශ්‍රී රාහුල අනුනාහිමි අභිනන්දනය, 1993, සංස් :- අත්තුඩාවේ පියරතන හිමි ප්‍රමුඛ පිරිස, , ගොඩගේ සමාගම, කොළඹ.

## Secondary Sourses of English


1. Dhadphale, M.G, Some Aspects of Buddhist Literary Criticism, as Pāli Sourses, 1975, Adreesh Prakashan, India.
2. Kane, P. V, History of Sanskrit Poetics, 1961, Motilal Banaradas Publishers pvt, Delhi.
3. Keith, Beridale, Classical Sanskrit Literature, 1947, YMCA Puplishning Nonse, Calefornia
4. Macdonel, Arthur, Antony, A History of Sanskrit Litrerature, 1990, Motilal Banaradas Publishers pvt, Delhi..
5. Macdonel, Arthur, Antony, A Vedic Reader For students, 1957, Oxford University Press.
6. Muller, Max, Ancient, Sanskrit Literature, 1926, Oxford IBH Puplishing, Bomboy.
7. Pandurano, kāsinam, (edit) Kādambari, 1910, Rājya Press, Bombey.
8. Raghavan, V. Studies on some Concepts of the Alamkara Sastra, 1942, The adyar hibrary, Adyax.
9. Raghunathachariya, Modern Sanskrit Literature, 2005, Mayank Printers, New Delhi.
10. Sastri, Gaurinath, A consise History of Classical Sanskrit Literature, 1943, Calcutta.


### කෝෂ ග්‍රන්ථ


1. පාලි - සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 1998, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
2. ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය, 1984, සංස්කෘතික අමාත්‍යංශය, කොළඹ.
3. සංස්කෘත සිංහල ශබ්දකෝෂය, අලගියවන්න, 2004, සූරිය ප්‍රකාශකයෝ, මරදාන.
4. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, i,ii භාගය, වැලිවිටියේ සෝරත හිමි, 1999, ගොඩගේ ප්‍රකාශන , කොළඹ


### Dictionaries


1. Dictionary of Buddhism, 2009, Soka Gakkai, Mortilal Banarsidas Pvt, New Delhi.
2. Dictionary of Pāli Proper Names, i, ii , 2011, G.P. Malalasekara, Asian Educational Services, New Delhi.
3. Sanskrit English Dictionary, 1988, Monier Williams, Munshiram Manaharalal Publishers, New Delhi.
4. Pāli – English Dictionary, 2007, Rhys Davids and William Stede, Mortilal Banarsidas Pvt, New Delhi.
5. The English – Pāli Dictionary, 1949, Widurupola Piyatissa Thera, The Colombo Apothecaries Company, Colombo.




1. විජිත, වෙලගෙදර, සාහිත්‍ය සහ සෞන්දර්ය- කලාවේ දාර්ශනික සංකල්ප, 2013, සූරිය ප්‍රකාශකයෝ, මරදාන, පි. 2.
2. ඥානසීහ හිමි, හේන්පිටගෙදර, සාහිත්‍යය, 2013, සමයවර්ධන, කොළඹ, පි. 01.
3. එම
4. "සාහිත්‍ය සංගීත කලා විහීන: - සාක්‍ෂාත් පශු: පුච්ඡ විෂාණහීන:
   තෘණං න ඛාදන්‍යපි ජීවමාහු: -තත් භාගධෙයං පරමං පශුනාම්", භර්තෘහරි
5. ගුණසේකර, චන්ද්‍රසේන, සාහිත්‍ය - ජනශ්‍රැතිය හා සංස්කෘතිය, 2012, සුදර්ශන ප්‍රකාශන, පි. 274.
6. අමරසේකර, ගුණදාස, විනෝදය හා විචාරය, 2009, විසිදුනු ප්‍රකාශන, කොළඹ 8, පි. 14.
7. එම, පි. 01
8. පාලි - සිංහල ආකාරාදිය, 2001, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල, පි. 185.
9. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, 1999, සෝරත හිමි, වැලිවිටියේ, ගොඩගේ සමාගම, කොළඹ, පි. 197.
10. ''සකල ප්‍රයෝජන මෞලිභූතං සමන්තරමෙව රසාස්වාදය සමුද්භූතං විහලික වෙද්‍යාන්තර මානන්දං ප්‍රභුසංවිත ශබ්ද ප්‍රධාන වේදාදි ශාත්‍රෙභ්‍යඃ සුහෘත්සංචිත''
    (කාව්‍ය ප්‍රකාශය) රේවත හිමි, උඩවෙල, සකු කව් ලකුණු, 2010, සමයවර්ධන, කොළඹ, පි. 10.
11. එම
12. ''කාව්‍යං රසාත්මකං වාක්‍යං'', විශ්වනාථ.
13. ''ශබ්දාර්ථෞ සාහිත්‍යෞ, කාව්‍යයම්'' - භාමහ
14. ''ගද්‍යං පද්‍යඤ්ච මිශ්‍රඤ්ච - තත් ත්‍රිධෛව්‍යවස්ථිතම්
    පද්‍යං චතුෂ්පදි තච්ච - වෘත්තං ජාතිරිතිද්විධා''
    කාව්‍යාදර්ශය, සංස්. වැලිවිට සෝරත හිමි, 2001, සමයවර්ධන, 11 ශ්ලෝකය, පි. 06.
15. අබේසිරිවර්ධන, ආනන්ද, රසාස්වාදය සහ චමත්කාරය, 2013, සමීර ප්‍රකාශන, බත්තරමුල්ල, පි. 45.
16. සුරවීර, ඒ. බී. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය, 2013, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ, පි. 20.
17. 'The Indian Tradition makes Vālmiki the author of the Rāmayana……" Concise History of Classical Sanskrit History, 1943, Calcutta.
18. තිලකසිරි, ජයදේව, සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, 2007, ගොඩගේ සහෝදරයෝ, කොළඹ, පි. 25.
19. රාමායණය, 02, 15 ශ්ලෝකය
20. "පති සම්මුඛා භවන්ති ඤෙයයා එතායාති පටිභා " එම, පි. 155.
21. "අපූර්ව වස්තු නිර්මාණක්‍ෂමා ප්‍රඥා" ආනන්දවර්ධන.
22. "කවිත්ව බීජං ප්‍රතිභානම්" වාමන.
23. සුරවීර, ඒ. වී. , පි. 158.

23 JUL 2019
පුස්තකාලය

24. චත්තාරො භික්ඛවේ කවි කතමෙ චත්තාරො චින්තාකවි සුතකවි අත්ථකවි පටිභානකවි ඉමෙ බො භික්ඛවේ චත්තාරො
කවි.... අංගුත්තර නිකාය, චතුක්ක නිපාතය, කවි සූත්‍රය
25. රුණ්ණමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ ගීතං, උම්මත්තකමිදං අරියස්ස විනයෙ නච්චං, අංගුත්තර නිකාය.
26. න භික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො ගායිතබ්බො. යො ගායෙය්‍ය ආපත්ති දුක්කටස්ස. චුල්ලවග්ගපාළි.
27. සංයුත්ත නිකාය, දේවතා සංයුක්තය.
28. විජයවර්ධන, හේමපාල, සංස්කෘත කාව්‍ය විචාර මූලධර්ම, 2003, සමීර ප්‍රකාශන, බත්තරමුල්ල, 12 පිට.
29. රත්නායක, මනෝජ්, ප්‍රසාත්, සංස්කෘත කාව්‍ය විචාරය, 2012, සරසවි ක්‍රියේෂන්, 20 පිට.
30. චත්තාරො භික්ඛවේ කවි කතමෙ චත්තාරො චින්තාකවි සුතකවි අත්ථකවි පටිභානකවි ඉමෙ බො භික්ඛවේ චත්තාරො
කවි.... අංගුත්තර නිකාය, චතුක්ක නිපාතය, කවි සූත්‍රය
31. අබේනායක. ඔලිවර්, බෞද්ධ අධ්‍යයන විමර්ශන, 2009, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, බොරැල්ල, පි. 283.